( 13 )

# පුරාණ ආභරණ සහ සමාජය

පී.ඒ.එස්. ප්‍රනාන්දු
සිව් වැනි වසර
pasfernando6@gmail.com

ලොව අතීත තොරතුරු හෙළි කර ගැනීමේදී උපයෝගී කර ගත හැකි ඉතා වටිනා පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස පුරාණ ආභරණ හඳුන්වා දිය හැකි ය. මෙතෙක් අනාවරණය කරගෙන තිබෙන පුරාවිද්‍යාත්මක මෙන්ම සමාජ විද්‍යාත්මක සාධකන්ට අනුව බලන කළ පුරාණ සමාජයන්හි ඇඳුමේ කොටසක් වශයෙන් ආභරණ පරිහරණ කළ ද, ඈත අතීතයේ දී ප්‍රාග් මානවයා ඇඳුම් භාවිතයට පෙර ද ආභරණ භාවිතය තිබෙන්නට ඇතැයි සැලකිය යුතු තරම් පුරාවිද්‍යාත්මක සාධක දැනට හමු වී තිබේ (අමරසිංහ,2000,87). මිනිසා ආභරණ පරිහරණය ආරම්භ කළ අවධියේ පටන්ම ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව ශරීර අංග, ප්‍රත්‍යංග අලංකාර කිරීමට ආභරණ සාදාගත් බවට පුරාවිද්‍යාත්මක සාධක එමට ය. එමෙන් ම ආභරණ මිනිසුන්ගේ නොයෙකුත් අවශ්‍යතාවයන් හමුවේ විවිධ මුහුහුණුවරින් යුතුව සමාජයේ කැපී පෙනුණු පුරා කෘතියක් ලෙස හඳුන්වා දිය හැක.

සිංහල විශ්ව කෝෂයේ දෙවැනි කාණ්ඩයේ ''සෞන්දර්යය අගය පිළිබඳ හැඟීමකින් පෞද්ගලික රුචියට හෝ සමකාලීන සිරිත් විරිත්වලට හෝ අනුව ශරීරයේ අංග ප්‍රත්‍යංගයන් අලංකාර කිරීම සඳහා රන්, රිදී, මුතු, මැණික්, පබළු, ඇත් දත් ආදී දෙයින් තනා පළඳිනු ලබන වස්තු'' ආභරණ ලෙස හඳුන්වයි (හෙට්ටිආරච්චි,1998,548).

පුරාණ ආභරණයන්ගෙන් හඳුනාගත හැකි පුරාවිද්‍යාත්මක තොරතුරු රැසක් ඇත. විවිධ ආකල්ප සහ සංකල්ප ඔස්සේ ආභරණ නිර්මාණය කර ඇති බව පෙනී යයි. එනම් අතීතයේ ආභරණ නිපදවන ලද ශිල්පීන්ගේ සහ ආභරණ පරිහරණය කරන්නන්ගේ ආකල්ප සහ සංකල්ප පිළිබඳ තොරතුරු පුරාණ ආභරණ තුළින් හඳුනා ගත හැක. ආභරණ නිෂ්පාදකයින් භාවිත කරන අමුද්‍රව්‍ය, නිෂ්පාදන ක්‍රම, සැරසිලි රටා, අමුද්‍රව්‍ය, නිෂ්පාදන ක්‍රම, සැරසිලි රටා, ආභරණයන්හි ප්‍රමාණය, ශිල්පීන්ගේ නිපුණත්වය, රුචිකත්වය සහ ඔවුන්ගේ අදහස් ආකල්ප මේ ආභරණ තුළින් නිරූපණය වේ. තවද ආභරණ පරිහරණය කරන්නන්ගේ රුචිකත්වය, අවශ්‍යතාවයට මුල් තැන දෙමින් ආභරණ නිපදවූවා විය හැක. එනම් ආභරණ ශිල්පීන්ගේ සහ ආභරණ පරිහරණය කරන්නන්ගේ අපූරු සුසංයෝගයක ප්‍රතිඵලයක් වශයෙන් ආභරණ හඳුන්වා දීමට පුළුවන. එබැවින් පුරාණ ආභරණ, තත්කාලීන ජනයාගේ ආකල්ප සහ සංකල්ප අධ්‍යයන කිරීමට ඇති ප්‍රබල මාධ්‍යයක් ලෙස යොදා ගත හැකි ය.

ආගමික හා අභිචාර විධික්‍රම හඳුනාගැනීම ට පුරාණ ආභරණ ඉවහල් වේ. ශ්‍රී ලංකාවේ සිදු කළ ප්‍රාග් ඓතිහාසික කැණීම්වලින්, ගොළුබෙලි කවච, සිප්පි කවච, සත්ත්ව අස්ථි, සත්ත්ව දත්,

පාෂාණ ආදී විවිධ අමුද්‍රව්‍ය වලින් නිර්මාණය කර ඇති පළඳනාවන් හමු වේ. උදා -: බටදොඹලෙන, ෆාහියන් ලෙන, පොත්ගුල් ලෙන, කුරගල පෙන්වා දිය හැකිය. මෙම පාෂාණ සහ සත්ත්ව කොටස්හි සිදුරක් සහිත බැවින් පුරාවිද්‍යාඥයින්ගේ එක් මතයක් වන්නේ අතීත මානවයා මෙම අවශේෂ ආභරණ ලෙස ලෙස භාවිත කරන්නට ඇති බව ය. සත්ත්ව දඩයම සහ ආහාර රැස් කිරීම ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ දිවි පෙවෙතෙහි ප්‍රධාන අංගයන් ය. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගුහා චිත්‍ර අතරත් ප්‍රමුඛ සිත්තම් වනුයේ විවිධ ඉරියව් සහිත සත්ත්ව රූපයෝ ය. මේ අනුව බලන විට සත්ත්ව අවශේෂ භාවිතයෙන් මෙන්ම භූ ගර්භයෙන් ලබාගන්නා පාෂාණ මඟින් ද ආභරණ සාදා පැළඳීම කිසියම් ආකාරයකට අභිචාරික හෝ ආගමික ඇදහිල්ලක ලක්ෂණයක් වශයෙන් ගිණිය හැකි බව ය (හේරත්,1997,26). ශ්‍රී ලංකාවේ මහාශිලා යුගයට අයත් නොයෙක් පබළු වර්ග භාවිත කොට තනා ඇති ආභරණ පිළිබඳ වාර්තා වේ. උදා -: ඉබ්බන්කටුව, මාන්තායි, පොම්පරිප්පු, ගුරුගල්හින්න, යාන් ඔය පෙන්වා දිය හැක. එනම්, මහාශිලා යුගයට අයත් සුසාන භූමි කැණීම් තුළින් මෙම ආභරණ හමුවීමෙන් පෙනී යන්නේ මොවුන් යම්කිසි අභිචාර ක්‍රමයක් සඳහා ආභරණ භාවිත කළ බව ය. එනම්, ඔහුගේ හෝ ඇයගේ මරණින් පසු ඔවුන් භාවිත කළ ආභරණ ද ඒ හා තැන්පත් කරන්නට ඇත. එනම් ඔවුන් මරණින් මතු ආත්මයක් පිළිබඳ විශ්වාස කරන්නට ඇත. තවද ලක්දිව ආභරණ පිළිබඳ අධ්‍යයනයේ දී විශේෂයෙන් ම සඳහන් කළ යුතු අවස්ථාවකි දේව විශ්වාස හා ඇදහිලි. මන්ද සෑම දේව පෙරහැරකදී ම දේව ආභරණ වැඩමවීම අතීතයේ පටන් සිදු කෙරෙන්නෙකි. උද අලුත්නුවර දැඩි මුණ්ඩ දේවාලය, පත්තිනි මහා දේවාලය, සිද්ද සූනියම් ගම්බාර දේවාලය, දෙවුන්දර උපුල්වන් දේවාලය. මීට අමතරව ඒ ඒ දේව රුවට අනන්‍ය වූ ආභරණ සහ ආභරණ වර්ණයන් ද ඇත. ශිව දෙවියන් අදහන්නන් ඇට වර්ග වලින් කල මාල වර්ග පැළඳිම. ඒ ඒ දෙවියන් අදහනන් ද එම වර්ණයෙන් ආභරණ පළඳිති. උද විෂ්ණු දෙවියන් අදහන්නන් නිල් මැණික් පැළඳීම, ඉන්ද්‍ර දෙවියන් අදහන්නන් රතු මැණික් පැළඳීම, අග්නි දෙවියන් සඳහා දියමන්තිද චන්ද්‍ර දෙවියන් සඳහා මුතු පැළඳීම ද දැකිය හැක. (හේරත්,1997,26) එනම් අතිතයේ පටන් වර්තමානය දක්වා මෙකී වර්ණයන්ගෙන් යුත් ආභරණ පළඳිනු ලබන්නේ ආගමික සංකල්පයන් පදනම් කරගෙන ය. තව ද ශාන්ති කර්මයන්හි උඩුවියන්, පාවඩ සහ භේරි නාදයන් මැද්දේ ආභරණ වඩම්වා යහනේ තැන්පත් කරයි. මේ තුළින් පෙනී යන්නේ විවිධ ආගමික සහ අභිචාර හෙළි කරන ප්‍රබල මාධ්‍යයක් ලෙස ආභරණ භාවිත කළ හැකි බව ය.

පුරාතන තාක්ෂණය අධ්‍යයනය කිරීමේදී ද ආභරණ වැදගත් පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස පෙන්වා දීමට පුළුවන. මානවයාගේ තාක්ෂණික අවධි සහ තාක්ෂණික ක්‍රමයන් හි ප්‍රගතිය ඇති වූ ආකාරය පිළිබඳ අධ්‍යයනයේදී ද පුරාණ ආභරණ බෙහෙවින් වැදගත් වේ. එනම් අමුද්‍රව්‍ය ලබාගැනීමේ සිට ඒවා නිමි ද්‍රව්‍ය බවට පත් කිරීම දක්වා භාවිත ශිල්ප ක්‍රම ආභරණ අධ්‍යයනයෙන් දැනගත හැක. ප්‍රාග් මානවයාගේ ආභරණ අධ්‍යයනයේ දී ඔවුනගේ තාක්ෂණය හඳුනාගැනීමට පුළුවන. එනම් ශිලා මෙවලම් මඟින් සිදුරු කර මේවා නිපදවා ඇති බව පර්යේෂණ තුළින් ඔප්පු වේ. මෙකී ශිලා තාක්ෂණයෙන් ඇරඹි ආභරණ පසුව රන්, රිදී කර්මාන්ත ආශ්‍රිත තාක්ෂණය යටතේ නිෂ්පාදනය විය. රන්, රිදී කර්මාන්තය පිළිබඳ මහාවංශයේ සහ සෙල්ලිපි මඟින්ද තොරතුරු අනාවරණය වී ඇත. මැණික් ගල්, පලිඟු වැනි වටිනා ගල් වර්ග කැපීම, ඔප දැමීම පුරාණ යුගයේ සිටම පැවති බව ය. එනම් ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම ලෙන්

ලිපිවල සඳහන් කබර, තලදර, මණිකර වැනි වචන වලින් පැහැදිලි වන්නේ එම යුගයේ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියලුණු ශිල්පීන් සිටි බව ය. මෙකී සියලු පුරාවිද්‍යාත්මක සාධක වලින් හෙළි වනුයේ විවිධ ආයුධ, ශිල්පීය ක්‍රම භාවිත කරමින් ඉතාමත් දියුණු තාක්ෂණික ක්‍රම යටතේ ලක්දිව ආභරණ නිෂ්පාදනය කර ඇති බවට ය. ලක්දිව පුරාණ තාක්ෂණය සහ එය වර්ධනය වූ ආකාරය පිළිබඳ තොරතුරු සපයන කදිම මාධ්‍යයක් ලෙස ආභරණ ඉවහල් කර ගත හැක.

ලක්දිව සමාජ සිරිත් විරිත් ක්‍රම පිළබඳව අධ්‍යයනයේ දී අපට ආභරණ උපයෝගී කර ගත හැක. මෙහිදී අභිෂේකකරණය ඉතාමත් ම වැදගත් වේ. ලක්දිව පවත්වනු ලැබූ පළමු අභිෂේක මහෝත්සවය දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකය යි. මෙය ඉන්දියාවේ පැරණි චාරිත්‍රයකි. දේවානම්පියතිස්ස රජුට අශෝක අධිරාජ්‍යයා විසින් අභිෂේකකරණය ට අවශ්‍ය සියලු දෑ එවූ බව මහාවංශයේ සඳහන් වේ. මෝලි, වටංස, පාමඞ යන ආභරණ තුනක් ගැන සඳහන් වේ. මෝලි (මෞලි) ඔටුන්න බව විශ්වාස කළ හැකි ය (අමරසිංහ,2000,96). මින් පසු කියවෙන රාජාභිෂේකයන්ගේ මෙම ආභරණ පැළඳීම චාරිත්‍රයක් වශයෙන් සිදු කළ බව පෙනී යයි. උද පළමු විජයබාහු අභිෂේක මංගල්‍යය, නිශ්ශංකමල්ල රජු තම ගල්පොත සෙල්ලිපියෙහි තම අභිෂේකය පිළිබඳව සඳහන් කොට ඇත. ශ්‍රී ලංකාවේ විවාහ සිරිත් විරිත් පිළිබඳ අධ්‍යයනයේ දී ආභරණ ඉතා ම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ විවාහ සංස්කෘතිය පිළිබඳ සාක්ෂි සෙවීමේදී උඩරට, පහතරට, කතෝලික, හින්දු, මුස්ලිම් ආදී වශයෙන් විවාහ සංස්කෘතීන් කීපයක් හමු වේ. මෙහිදී ඒ ඒ ජනවර්ගයේ අනන්‍යතාවය ඉස්මතු වන පරිදි මංගල ආභරණ සකස් කොට තිබේ. උදාහරණයක් ලෙස උඩරට සිරිත් විරිත් අනුව මනාලයා මුළු ඇඳුම නමින් හඳුන්වන උඩරට පාරම්පරික ඇඳුමෙන් සහ ආභරණයෙන් සැරසී සිටින අතර මනාලිය ද ඔසරියෙන් සහ ඊට ම ආවේණික වූ ආභරණයන්ගෙන් සැරසී සිටී. උද ඉර, හඳ, මාල හත. යුරෝපීයන් මෙරට ආක්‍රමණය කිරීමෙන් පසු නොයෙකුත් වර්ගයේ ආභරණ මෙරට පැතුරිණ. කුර හතර, පනාව, කරාබු ජෝඩුව හා කස්තිඥ්ඥවැලක් මනාලයා විසින් මනාලියට දිය යුතු ආභරණ සේ පෘතුග්‍රීසි සිරිතක් විය. එය ක්‍රමයෙන් මෙරට ප්‍රචලිත විය (ලගමුව,2000,8). අතීත සමාජයේ එක් එක් ජනවර්ගයේ සිරිත් විරිත් පිළිබඳ තතු හෙළි කරගැනීම සඳහා ආභරණ යොදා ගත හැක.

සමාජයේ විවිධ මට්ටම්වල පුද්ගලයන් විසින් පරිහරණය කරන ලද ආභරණ අනුව තත්කාලීන සමාජ ස්ථරායනය හඳුනා ගැනීමට ද ආභරණ භාවිත කළ හැක. එහිදී මහනුවර යුගය වඩාත් සුවිශේෂී වේ. මහනුවර යුගයට අයත් සමාජ ස්ථරායනය, තනතුරු හා සමාජ පන්තීන් ඒ ඒ ස්ථරයට අයත් ආභරණ තුළින් පැහැදිලි වේ. සමාජය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම එකල සමාජයේ මිනිසුන්ගේ රුචිකත්වය, සමාජ බලපෑම, සමාජානුයෝජනය වීම එයට ආභරණ බලපෑ ආකාරය අවබෝධ කරගත හැකි ය. රොබට් නොක්ස් ශ්‍රී ලංකාව පිළිබඳ රචිත ''An Historical Relation of Ceylon'' නැමති කෘතියෙහි '' පිරිමි ඔවුන්ගේ අතැඟිලිවල රිදියෙන්, තඹ වලින් සහ පිත්තලෙන් කළ මුදු පළඳිති. වංශවතුන් පළඳිනුයේ රන් මුදුය'' (Knox,1958,143. හේරත්,1997,26). පේරස් මුද්ද වැනි රාජකීයන්ට පමණක් සීමා වූ ආභරණ උඩරට සමයේ තිබුණි. (ලගමුව,1997,8) නළල් පට වනාහි රජු හෝ අන්‍යයන් පළඳින, රනින් හෝ මැණික් ඔබ්බා හෝ කරන ලද නළල් තහඩුවකි. නිළම වරුද පට

බැඳි නමකින් ගෞරව කරනු ලැබූ කාර්මිකයෝ ද එය පළඳිති. දෙවැන්නත් විසින් පළඳින නළල් පටය පට තහඩුව නම් (කුමාරස්වාමි,1962,206). මේ තුළින් මහනුවර යුගයේ සමාජ ස්ථරායනය පිළිබඳ අවබෝධයක් ගත හැකි ය.

විදේශීය රටවල් සමඟ දක්වා ඇති සබඳතාවය සහ විදේශීය බලපෑම් මෙරට ක්‍රියාත්මක වූයේ කෙසේ ද යන්න පුරාණ ආභරණ මඟින් හෙළි කර ගත හැක. මෙරට හා රටවල් අතර පැවති වාණිජ, දේශපාලන, සංස්කෘතික සබඳතා පිළිබඳවත් ආභරණ තුළින් අනාවරණය වේ. ඉබ්බන්කටුව, අනුරාධපුරය, තිස්සමහාරාමය, පොළොන්නරුව ආදී ස්ථාන රාශියකින් හමුව ඇති කාර්නිලියන් ආභරණ නිෂ්පාදනය සඳහා යොදා යොදා ගෙන ඇත. කාර්නිලියන් මෙරටට හමුනොවන අතර මෙහි නිජබිම ඉන්දියාවේ ඩෙකැන් ප්‍රදේශයයි. මේ තුළින් පෙනී යන්නේ ඈත අතීතයේ පටන් මෙරට හා ඉන්දියාව අතර පැවති වාණිජ සබඳතා ය. විජය කුමරුට විවාහ වීම සඳහා මදුරාපුරයෙන් ගෙන ලද කුමරිය සමඟ අටලොස් ශිල්පීන්ගේ කුල දහසක් එවූ බව මහාවංශයේ සඳහන් වේ. මෙම ශිල්පීන් අතර ස්වර්ණාකාර කුලයට අයත් රන්කරුවන් ද සිටි බවට පැවසෙන නිසා එකල ආභරණ සඳහා භාරතීය ස්වරූපයක් ලැබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. (අමරසිංහ,2000,94) මීට අමතරව දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකය සඳහා රාජ්‍ය කකුධ භාණ්ඩ අතර ආභරණ ද මෙරටට එවා ඇත. මේ තුළින් පෙනී යන්නේ රාජ්‍යයන් අතර පැවති සුහඳ සබඳතා ය. පොළොන්නරු යුගයේ ද්‍රවිඩ බලපෑම ලක්දිව ඇතිවන්නට විය. මෙම යුගයේ හමුවන කලා කෘති වල මෙන්ම ආභරණ වලද ද්‍රවිඩ කලා ශිල්ප වල ආභාසය දක්නට ලැබේ. එනම් විදේශීය බලපෑම් මෙරට ක්‍රියාත්මක වී ඇති ආකාරය මේ තුළින් පෙනී යයි. යුරෝපීයන් මෙරට ආක්‍රමණය කිරීමෙන් පසු නොයෙකුත් ආකාරයේ ඔවුන්ගේ ආභරණ මෙරට පැතුරිණ. එනම් විදේශීය බලපෑම දේශීය සංස්කෘතියට එක් වීම සහ එයට දැක්වූ ප්‍රතිචාරය ආභරණ මඟින් කදිමට නිරූපණය වේ. මීට අමතරව කාසි කැරැල්ල බැඳි ඔරලෝසු මාලය ඉංග්‍රීසි සමයේ මුල් කාලයේ මෙරට ප්‍රචලිත වූ ආභරණයකි (ලගමුව,2000,8.) මෙරට ඇති වූ විදේශීය බලපෑම් අධ්‍යයනය සඳහා පුරාණ ආභරණ මහත් සේවාවක් සපයයි.

අතීත වැසියාගේ පුම්තිරිභාවය අනුව ඔවුන්ගේ භූමිකාව අධ්‍යයනයේදී ද ආභරණ ඉතාමත් වැදගත් වේ. පුම්තිරිභාවය නොහොත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යන්නෙන් ගැහැණු සහ පිරිමි අතර සමාජීය වශයෙන් ඇති වෙනස හැඟවේ. මේ පිරිස අතර ශාරීරික වශයෙන් හා ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රී පුරුෂ අතර වෙනස්කම් මෙහි දී වඩාත්ම වැදගත් සාධකයන් වේ. පුරුෂයන් තම සමාජ තත්ත්වය, පෞරෂත්වය ආදිය ස්ඵුට කිරීමට ආභරණ භාවිත කර ඇත. පුරුෂ ආභරණ නිර්මාණයේදී වඩාත් ම අවධාරණය කර ඇත්තේ ඔවුන්ගේ පෞරෂත්වය රැකෙන පරිදි ය. රාජ්‍ය ආභරණ නිර්මාණයේ දී තේජස ගාම්භීරත්වය රැකෙන පරිදි අන් අයගේ අවධානය රැකෙන පරිදි එය සැලසුම් කර ඇත. උදාහරණ ලෙස රාජ ඔටුන්න සහ උඩරට මුළු ඇඳුමේ එන කිණිස්ස පෙන්වා දිය හැක. කාන්තාවන් හුදෙක් තම අලංකාරණය උදෙසා ආභරණ භාවිත කර ඇති බව පෙනී යයි. උදාහරණ ලෙස මාල වර්ග, කර්ණාභරණ, හිස් පළඳනා, මේඛලාභරණ, වළලු ආදිය කාන්තාවගේ ශරීරයේ හැඩය අනුව නිර්මාණය කර ඇත. එනම් මෙකී ආභරණ වර්ගීකරණයට හේතු වී ඇත්තේ පුද්ගල ස්වරූපයයි.

මෝර්ටිමර් විලර් ප්‍රකාශ කර ඇති ආකාරයට පුරාවිද්‍යාවේ කොඳු ඇටය සේ සළකන කාලනිර්ණයන් සඳහාත් පුරාණ ආභරණ යොදා ගත හැක. එනම් පුරාවිද්‍යාත්මක කැණීම් කටයුතු සිදු කරනු ලබන අවස්ථා වලදී හමු වන ආභරණ කොටස් මඟින් ඒවා හමු වූ ස්ථරයන්ට වක්‍රව කාලනිර්ණයක් දිය හැකි ය. එනම් පුරාවිද්‍යා අධ්‍යයනවලදී කාලනිර්ණ ක්‍රමයක් ලෙස ආභරණයන්හි විවිධ වූ ලක්ෂණ අනුව එනම් නිෂ්පාදන අමුද්‍රව්‍ය, තාක්ෂණ ක්‍රමවේදය, මෝස්තර රටා සහ හැඩය අනුව කාලනිර්ණ මාධ්‍යයක් ලෙස ආභරණ භාවිත කළ හැක. එනම් එක් එක් කාලපරිච්ඡේද වලදී ආභරණ සඳහා යම් යම් මෝස්තර රටා ආවේණික ය. එනම් අනුරාධපුරයේ ආභරණ සඳහා  පබළු භාවිත කර ඇති සාදා ඇති ආභරණ සඳහා ඉතාමත් සරළ මෝස්තර රටා ඒ තුළින් දැක ගත හැකි වේ. නමුත් පොළොන්නරු යුගය වන විට ද්‍රවිඩ ආභාසය සහිත සංකීර්ණ මෝස්තර රටා භාවිතයට ගෙන ඇත. මහනුවර යුගයට එන විට සංකීර්ණ බවින් සහ එම යුගයට ම ආවේණික මෝස්තර රටා දැකගැනීමට පුළුවන. උදාහරණ ලෙස හංස පූට්ටු මාලය, පොල්මල් මාලය, පෙති මාලය. එබැවින් ආභරණ විවිධ ක්‍රම ඔස්සේ කාලනිරිණ ක්‍රමයක් ලෙස අධ්‍යයනය සඳහා කදිම මාධ්‍යයකි.

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම යුගයෙන් යුගය මානවයා පැමිණි ගමන් මඟ පුරාවට ආභරණ සුවිශේෂී සාධකයක් විය. සමාජීය චර්යාව හෙළි කරන එනම් හැසිරීම, ආගම, සංස්කෘතිය, විද්‍යාව, අදහස් සහ සංකල්ප මේ සෑම දෙයක් පිළිබඳව පුරාණ ආභරණ අධ්‍යයනය තුළින් දැන ගත හැකි වේ. තව ද පුරාවිද්‍යාත්මක දත්ත රැස්කිරිමේ ප්‍රබල මාධ්‍යයක් ලෙස ද පුරාණ ආභරණ පෙන්වා දිය හැක.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**

අදිකාරි, ගාමිණි. ප්‍රේමරත්න, එස්. ආර්. මනමේන්ද්‍ර-ආරච්චි. 2013, ***ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බෙල්ලන්ගෙන් නිර්මිත පබළු හා පළඳනා,*** The Journal of Archaeology and Heritage Studies, සංස්: තිස්ස වීරසේකර, පුරාවිද්‍යාව හා උරුමකළමණාකරන අධ්‍යනංශය, රජරට විශ්වවිද්‍යාලය. පිටු අංක 2.

අමරසිංහ, මාලිංග. 2000, ***සිංහලේ පුරාණ ඇඳුම් ආයිත්තම්***, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

අමරසිංහ, මාලිංග. 2007, ***පැරණි ලක්දිව වස්ත්‍රාභරණ***, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ .

කුමාරස්වාමි, ආනන්ද. 1962, ***මධ්‍ය කාලීන සිංහල කලාව***, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

මල්කාන්ති, නාලනී. 2008, ***පබළු නිර්මාණ***, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය, කොළඹ.

හෙට්ටිආරච්චි, ඩී.ඊ. 1998, ***සිංහල විශ්වකෝෂය දෙවැනි කාණ්ඩය***, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

හේරත්, යමුනා. 1997, ***පුරාණ ආභරණ හෙළි කරන පුරාවිද්‍යාත්මක තොරතුරු,*** සංස්කෘතික පුරාණය, සංස්: ටී. ජී. කුලතුංග, යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණය, මධ්‍යම සංස්කෘතික අරමුදල. පිටු අංක 26.

ලගමුව, ඒ. 2000, ***ශ්‍රී ලංකාවේ පැරණි ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රභවය, විකාශය, හා තාක්ෂණික ශිල්ප ක්‍රම***, කෞතුකාගාර 6 වෙනි කලාපය, සංස්: එච්. ඒ. ඒකනායක සහ රංජිත් හේවගේ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව. පිටු අංක 8